# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1773/38 - 2012 අගෝස්තු මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2012.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/15/12/2009.

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ, 2010.11.22 දිනැති හා අංක 1681/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2010.11.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 12, ගුණසිංහ පුර, අංක H.L. 3-4 හි පදිංචි පී. ඩබ්. සී. වෙඩික්කාර මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක. 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2012.08.09 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2012 අගෝස්තු මස 24 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පී. ඩබ්. සී. වෙඩික්කාර මයා,
අංක H.L. 3-4, ගුණසිංහ පුර,
කොළඹ 12,

(පළමු පාර්ශවය)

*නඩු අංකය* : A–3353

*සහ*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500,
ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

(දෙවන පාර්ශවය)

අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධ

### ප්‍රදානය

කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන ඇමති ගාමිණී ලොකුගේ මහතා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39, (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවෙන) පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ජේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමාට පැවරී ඇති බලතල අනුව, උක්ත ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2010.11.10 දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ :-

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවය කර 2007.01.15 වැනි දින සිට සේවයෙන් විශ්‍රාම ලැබූ පී. ඩබ්. සී. වෙඩික්කාර මහතා ඒ වන විට දරමින් සිටි I වන ශ්‍රේණියේ පාලන සහකාර තනතුර 1983.01.01 වෙනි දිනට පෙරදාතම් කර ඒ අනුව මෙහි පහතින් දක්වා ඇති පරිදි උසස්වීම් සඳහා ඔහු හිමිකම් ලබන්නේද යන්න හා නොඑසේ නම්, ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව ද වේ.

(i) 1984.01.01 දින සිට පාලන නිලධාරි II තනතුරට උසස් කිරීම.
(ii) 1998.08.01 දින සිට පාලන නිලධාරි I තනතුරට උසස් කිරීම.
(iii) 1994.01.01 දින සිට සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුරට උසස් කිරීම.
(iv) 1998.01.01 දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) තනතුරට උසස් කිරීම.
(v) 2000.01.01 දින සිට අධ්‍යක්ෂ තනතුරට උසස් කිරීම.

**පෙනී සිටීම**

මෙම නඩුවේ පළමු පාර්ශවය වන පී. ඩබ්. සී. වෙඩික්කාර මහතා පැමිණ සිටි අතර, ඔහු වෙනුවෙන් නියෝජිත විල්බට් පෙරේරා මහතා නියෝජනය කළ අතර, දෙවන පාර්ශවය වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙනුවෙන් නීති නිලධාරිනී ප්‍රසංගා අයිලප්පෙරුම

1 A – G 16536 — 350 (2012/08)

මහත්මිය නඩු විභාගය අවසන් වන තුරු පෙනී සිටින ලදී. කෙසේ වෙතත් 2012.05.26 වෙනි දින නියෝජිත විල්බට් පෙරේරා මහතා මිය යෑමෙන් පසුව 01 වන පාර්ශවකරුගේ උරුමකරුවන් වන බිරිඳ ගල්ගමුව ආරච්චිගේ කුසුමා (568512022v), පුතා කාංචන උදයංග වෙඩික්කාර (861262054v), දුව නවෝදි සංදීපා වෙඩික්කාර (925092185v) යන අය පෙනී සිටින ලදී.

පාර්ශවයන් විසින් විධිමත් ලෙස ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2011.03.03 වෙනි දින විභාගය ආරම්භ කරන ලද අතර, මාගේ නියමය පරිදි 02 වන පාර්ශවය විසින් ප්‍රථමයෙන් සාක්ෂි මෙහෙයවීම ආරම්භ කරන ලදී. 02 වන පාර්ශවය විසින් 2011.12.19 වෙනි දින සාක්ෂි අවසන් කරන ලදී. 01 වන පාර්ශවය විසින් 2012.01.17 වෙනි දින සාක්ෂි ආරම්භ කළ අතර, 2012.04.12 වෙනි දින අඩක් සාක්ෂි ලබා දීමෙන් පසුව 01 වන පාර්ශවකරු මිය ගොස් ඇත. ඉන් අනතුරුව 01 වන පාර්ශවකරුගේ නියෝජිත විල්බට් පෙරේරා මහතා 2012.05.26 වෙනි දින මිය ගොස් ඇත. ඉන් පසුව 01 වන පාර්ශවකරුගේ උරුමකරුවන් වන බිරිඳ ගල්ගමුව ආරච්චිගේ කුසුමා (568512022v), පුතා කාංචන උදයංග වෙඩික්කාර (861262054v), දුව නවෝදි සංදීපා වෙඩික්කාර (925092185v) යන අය ආදේශය කිරීමට උත්සාහ කර ඇත. කෙසේ වෙතත් 02 වන පාර්ශවකරු වෙනුවෙන් පෙනී සිටි නීති නිලධාරිනි ප්‍රසංගා අයිලප්පෙරුම මහත්මිය පෙනී සිටිමින් 01 වන පාර්ශවකරුගේ ආදේශ නීතිමය පදනම මත නොකරන නිසා ඒ සම්බන්ධයෙන් දැඩි විරුද්ධත්වය පළ කර ඇත. ඒ හේතු කොට ගෙන 2012.07.31 වෙනි දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේදී 01 වන පාර්ශවකරු වෙනුවෙන් 01 වන පාර්ශවකරුගේ පුතා වන කාංචන වෙඩික්කාර යන අය මෙසේ කියා සිටින ලදී.

"මෙම නඩුව අද දින ඉල්ලා අස්කර ගැනීමට කැමැත්ත පළ කර සිටිමි. 02 වන පාර්ශවකාර ආයතනයත් සමග සාකච්ඡා කිරීම පළක් නොවන බව විශ්වාස කරමි. ඒ අනුව මෙම නඩුව මින් ඉදිරියට ගෙන යෑමට කැමැත්තක් නොමැති බව ප්‍රකාශකර සිටිමි."

2012.07.31 වෙනි දින 01 වන පාර්ශවකරුගේ ප්‍රකාශය සලකා බැලීමේදී මට පෙනී යන ආකාරයෙන් මේ නඩුව ගෙන යෑමට කටයුතු නොකරන බව ඉතා පැහැදිලිව පෙනී යයි. එසේම දැනට අඩක් සාක්ෂි ලබා දී ඇති ඉහත සඳහන් 01 වන පාර්ශවකරු වන පී, ඩබ්. සී. වෙඩික්කාර යන අය මිය ගොස් ඇති නිසා මේ නඩුව මින් ඉදිරියට ගෙන යෑමට ඉඩකඩ නැත.

ඉහත සඳහන් කරන ලද හේතු සැලකිල්ලට භාජනය කිරීමෙන් පසුව ප්‍රදානය සම්බන්ධව කටයුතු කිරීමට ඉඩ අවස්ථාවක් නැති නිසා මෙම නඩු ගොනුවට ඉදිරිපත් කර ඇති ලේඛන සහ සාක්ෂි පිළිබඳව සලකා බැලීමේදී 01 වන පාර්ශවකරුගේ ආදේශ කිරීම සම්බන්ධව 01 වන පාර්ශවකරු ස්ථාපිත කිරීමට ඉඩ ප්‍රස්ථාවක් නොතිබූ නිසා මේ නඩුවේ ප්‍රදානයක් කිරීමට ඉඩ නැත.

ඒ අනුව ප්‍රදානයක් නොකරමි.

මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්තිසහගත බව මගේ නිගමනය වේ.

ටී. එඩ්මන්ඩ් සාන්තරාජන්,
බේරුම්කරු.

2012 අගොස්තු මස 09 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

09 - 428

---

*මගේ අංකය* : IR/13/06/2011.

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ, 2011.12.29 දිනැති හා අංක 1738/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2011.12.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් මතුගම, හිරිකැටිය, මාස්ලියද්ද හි පදිංචි ආර්. ජී. ඩී. සකරාජා මහතා හා අනෙක් පාර්ශවය වශයෙන් අගලවත්ත, ඩාර්ටන්ෆීල්ඩ් හී පිහිටි ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2012.07.31 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2012 අගෝස්තු මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

ආර්. ජී. ඩී. සකරාජා මහතා,
මාස්ලියද්ද,
හිරිකැටිය, මතුගම

(පළමු පාර්ශවය)

*නඩු අංකය* : A–3423

*සහ*

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය,
ඩාර්ටන්ෆීල්ඩ්,
අගලවත්ත

(දෙවන පාර්ශවය)

අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධ

**ප්‍රදානය**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39, (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදාන) පනත සමග කියවෙන) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමාට පැවරී ඇති බලතල අනුව, උක්ත ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2011.12.23 දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :-

"ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ සේවය කළ ආර්. ජී. ඩී. සකරාජා මහතාට ඔහුගේ මුල් පත්වීම දින සිට ලබාදුන් වැටුප් තලය නිවැරදි වන්නේ ද? එසේ නොවන්නේ නම් කුමන සහනයන් හිමිවිය යුතු ද යන්නත් වේ."

**පෙනී සිටීම**

මෙම නඩුවේ පළමු පාර්ශවය වන ආර්. පී. ඩී. සකරාජා මහතා පැමිණ සිටි අතර ඔහු වෙනුවෙන් නියෝජිත පියසිරි මල්මුතුගේ මහතා පෙනී සිටින ලදී. දෙවන පාර්ශවය වන ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය වෙනුවෙන් නීතිඥ එස්. තලෙයිසිංහම් මහතා පෙනී සිටි අතර ආයතනය නියෝජනය කරමින් පරිපාලන සහකාර පී. මණ්ඩලවත්ත මහත්මිය පැමිණ සිටින ලදී.

පාර්ශවයන් විසින් විධිමත් ලෙස ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2012.02.02 දින මෙම නඩුව ආරම්භ කරන ලදී.

ඉන්පසු මෙම නඩුව 2012.02.21 දින කැඳවූ අවස්ථාවේදී දෙවන පර්ශවය විසින් මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව දෙපාර්ශවයට ඒ සම්බන්ධයෙන් ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී. ඒ අනුව දෙපාර්ශවය විසින් මෙම නඩුව ඉදිරියට පවත්වාගෙන යා හැකිද නොහැකිද යන්න පිළිබඳ ලිඛිත දේශන ඉදිරිපත් කරන ලද අතර පළමු පාර්ශවයේ ලිඛිත දේශනය සලකා බැලීමේ දී ආරවුලට විසඳිය යුතු කරුණ හැර මෙම නඩුව පවත්වාගෙන යැමට ඉඩ කඩ ඇති බවට කරුණු සැල කර ඇත.

දෙවන පාර්ශවකරුගේ ලිඛිත දේශනය සලකා බැලීමේ දී එහිදී ඔවුන් විසින් මෙම නඩුව ඉදිරියට පවත්වාගෙන යැමට නොහැකි බවට ප්‍රධාන කරුණු 2ක් ඉදිරිපත් කර ඇත. එනම් 02 වන පාර්ශවය කියා ඇත්තේ නීතිමය පදනමක් නැති නිසාත් සේවායෝජක හා සේවකයා අතර සම්බන්ධතාවය නැතිවී ඇති නිසාත් ඒ අනුව මෙම නඩුව ගෙන යැමට ඉඩ නැති බවත් හා 01 වන පාර්ශවකරු 2006.04.14 විශ්‍රාම ගිය පසුව ඒ සම්බන්ධව ප්‍රමාද දෝෂයක් තිබෙන බවය. ඒ ප්‍රමාද දෝෂය නිසා සාධාරණ සහ යුක්තිසහගත කරුණු සම්බන්ධව සලකා බැලීමේ දී මෙම නඩුව ඉදිරියට ගෙන යැමට ඉඩ නැති බවත්ය.

මෙම නඩුවේ පළමු පාර්ශවකරුගේ ඇස් පෙනීමේ දුර්වලතාවය ද සැලකිල්ලට ගත යුතු කරුණකි. ඒ නිසා අවසානයේදී එනම් 2012.07.24 දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ පළමු පාර්ශවකරුගේ නියෝජිත මහතා මෙසේ කියා සිටින ලදී. එනම්,

"අද දින මෙම නඩුවේ සාක්ෂි ආරම්භ කිරීම සඳහා අවසාන දිනය වශයෙන් නියම කර ඇත. සාක්ෂි විමසීමට අවශ්‍ය ලේඛන වල මුල් පිටපත් නොමැති බැවින් මෙම නඩුවේ ඉදිරියට සාක්ෂි මෙහෙයවීමේ අපහසුතාවයක් පැන නැගී ඇත. ඒ අනුව මෙම නඩුවේ සාක්ෂි මෙහෙයවීම අද දින අවසන් කරන අතර දැනට නඩු ගොනුවේ අති ලේඛණ සැලකිල්ලට ගෙන ගරු අධිකරණයට සුදුසු තීරණයක් ගන්නා මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි. ඒ අනුව පළමු පාර්ශවයේ සාක්ෂි මෙහෙයවීම මින් අවසන් කරන අතර ඉදිරියට සාක්ෂි මෙහෙයවීමක් නොකරන බව කියා සිටිමි. පළමු පාර්ශවකරු මෙම තත්වයට එකඟතාවය ළ කරයි."

මෙම සියලු කරුණු සලකා බැලීමේදී මා හට පෙනී යන්නේ පළමු පාර්ශවකරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛණ සියල්ල ඡායා පිටපත් බවයි. එසේම පළමු පාර්ශවකරුගේ මුල් පත්වීමේ ලිපිය ඉදිරිපත් කර නැති නිසා ආරාවුලට තුඩුදුන් හේතුවද විසඳීමට හැකියාවක් නැත. වැඩිදුරටත් සලකා බැලීමේ දී පළමු පාර්ශවය සාක්ෂි මෙහෙයවීමක් සිදු නොකරන බවද කියා සිටින ලදී. ඒ අනුව මෙම නඩුව ඉදිරියට ගෙන යැමට ඉඩ නැත. ඒ නිසා ප්‍රදානයක් කිරීමට සාක්ෂි නොමැති නිසා ප්‍රදානයක් නොමැති සේ සලකා ප්‍රදානයක් නොකරමි.

මෙය සාධාරණ හා යුක්තිසහගත ප්‍රදානයක් බව මාගේ නිගමනය වේ.

ටී. එඩ්මන්ඩ් සාන්තරාජන්,
බේරුම්කරු.

2012 ජුලි මස 31 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

09 - 429